


# වාසෙක්තමි

අන්න වාසෙක්තමි යනවා. එකළ මම බස් නැවතුම් පොළේ සිටිය දී තරුණයෙකුගේ මුවන් ඇසුණු එම වදනින් මම වටපිට බැලිමි. බස් නැවතුමට අනික් පසින් ගමන් කරන්නේ මා දන්නා හඳුනන ගමේම පදිංචි චන්ද්‍රිකා අක්කාය. චන්ද්‍රිකා අක්කාව වාසෙක්තමි කියා හඳුන්වන බව මා දැන ගත්තේ එදාය. පසුව මම ඒ පිළිබඳව විපරම් කළෙමි. ඒ කතාව මෙසේය.

ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩු සමයේ 83 ජූලි කළබල වලින් පසු කාලෙක වාසෙක්තමි සැත්කම හඳුන්වා දුන් බව ඔබ ලංකාවෙ ජීවත් වූ ඔබ සැමට මතක ඇතැයි මම සිතමි. සීග්‍රයෙන් වර්ධනය වූ ජනගහණය පාලනය කිරීම උදෙසා පවුල් සංවිධානය සංගමය හරහා හඳුන්වාදුන් මෙම සැත්කමට මුහුණ දුන් පිරිමියෙකු වෙනුවෙන් රුපියල් පන්සියක ප්‍රදානයක් කළේද රජය මගිනි. එම සැත්කමට මුහුණ දුන් බොහෝ අය දරුවන් සිටි පියවරුය. එසේම දුගී දුප්පත්කමින් වෙලී සිටි රුපියල් පන්සියක මුදලින් දවසක් දෙකක් කාබී සතුටු වන්නට තීරණය කළ අපේම මිනිසුන්ය. ඔවුන් සමහරක් බේබද්දන්ය. සමහරුන් මතට ලොල් වූවන්ය. සමහරුන් මේ දෙකටම නැති දරු පවුල් නඩත්තු කරන්නට වෙරදරන අහිංසක පියවරුන්ය. එසේම වා-සෙක්තමයට ජාති භේදයක් තිබුණේ නැත තිබුණේ පන්ති භේදය පමණි වාසෙක්තමයේ අගය දැනුණේ නැති බැරි මෙන්ම මතට ලොල්වූ එකාට පමණි

චන්ද්‍රිකා අඟලුම් කම්හලක සේවය කළ සේවිකාවකි. ඇයගේ ගම මිහින්තලේය. එහෙත් රාජගිරියේ පිහිටි ඇඟලුම් කම්හලේ රැකියාව නිසා ඇය බත්තරමුල්ලේ කුඩා නවාතැනක නැවතී රැකියාවට ගියාය. මත්කුඩු වලට ලොල් වූ සුනිල් කඩවසම්ය. තරුණියකගේ සිත පැහැර ගැනීමට තරම් ආකර්ශණයක් ඔහුගේ රූපය තුළ රැඳී තිබුණේය. දෑස් කුඩාකර සිනා-සෙන සුනිල්ගේ ආදරය ඇය වෙත පිරි නැමිණි. ඒ බස් රථයක් තුළ මුල් වරට මුණ ගැසීමෙනි. චන්ද්‍රිකා තමන්ගේ පෙම්වතාට පණ මෙන් ආදරය කළාය. එහෙත් සුනිල් මත්කුඩුවලට ඇබ්බැහි වී සිටින බව ඇය ඒ වෙනතුරුත් නොදැන සිටියාය. එසේම ඇයට මුණ ගැසුණු සුනිල් වාසෙක්තමි සැත්කම කරගත් පිරිමියෙකු බවද ඇය නොදත්තාය.

ඇත. එසේම ඔහු දැන් කිසිදු මතකට ලොල් නොවූ සිංහල ජාතිය වෙනුවෙන් පෙනී සිටින ජාති හිතෛෂියෙකි. සුනිල්ට චන්ද්‍රිකාටත් ගමේම මිනිසුන් අමතන්නේ වාසකම කියාය. ඒ ඔවුන් නොමැති තැනය. එහෙත් අසරණ චන්ද්‍රිකා අක්කා ඒ බව දැන ගත්ත ද ඇය ඒ අපහාසයට උපේක්ෂාවෙන් සිනා-සෙයි. එහෙත් මෙතැන ඇති ලොකුම ගැටලුව වන්නේ



මගේ කතාවේ කතා නායකයා සුනිල්ය. සුනිල් අවිවාකයෙකි. නමුත් පෙම්වතෙකි. සාමාන්‍ය මධ්‍යම පාන්තික පවුලක උපන් සුනිල්ට එකල රැකියාවක් නොතිබූ අතර ඔහු රැකියාවක් සොයා ගැනීමටද එතරම් වෙහෙස නොවූ පුද්ගලයෙකි. දෙමව්පියන්ට බරක් වෙමින් තුන් වේල සරි කර ගත් සුනිල් තරමක් දඩබ්බර චරිතයක් වූ අතර ඔහු ආශ්‍රය කළේ ද එවැනි මිතුරන්ය. එම මිතුරු ආශ්‍රයේ

***<u>සුනිල් මාලබේ පොළේ කුඩා ව්‍යාපා රයක් කරගෙන යන අතර ඔහුට ත්‍රිරෝද රථයක් ද උරුම කර දුන්නේ චන්ද්‍රිකා අක්කාය.</u>***

අවසාන ප්‍රතිඵලය වූයේ ඔහු මත්ලෝලියෙකු වීමය. මතට තිබූ ලොල් බව නිසාම ඔහු මුදල් සොයා ගැනීමට පෞද්ගලික ආරක්ෂක සමාගමක මුරකරුවෙක් ලෙස සේවය කළද, පසු කළෙක ඔහුව එම සේවා ස්ථානයෙන් පන්නා දැමුවේ රාත්‍රි කාලයේ මත්කුඩු වලින් සප්පායම් වී රාජකාරී කටයුතු පැහැර හැරීම නිසාය. අනතුරුව ගමෙ ගොඩෙ සොරකම් කටයුතු වල යෙදෙමින් මුදල් සොයාගත් සුනිල්ට අවසානයේ මත් කුඩු මිලදී ගැනීමට කිසිදු ක්‍රමයක් නොවූ තැනු දෙමව්පියන්ගේ කණ කර ආභරණ මුදල් සොරකම් කරමින් මත් වන්නට පටන්ගත්තේය. දෙමව්පියන් මේ සියල්ල ඉවසා සිටියේ පුත්‍ර සෙනෙහස නිසාය.

දිනක් මත්කුඩු නොමැතිව ආතක් පාතක් නැතිව ඔහේ ඇවිදිමින් සිටි සුනිල් තවත් මතට ලොල් වූ දරුවන් සිටින පියෙකු සමග රජයේ රෝහලට රිංගා පියෙකු මෙන් පෙනී සිට වාසෙක්තම සැත්කම කරවාගත්තේ රුපියල් පන්සියේ දීමනා-වෙන් මත්කුඩු මිලදී ගැනීමටය. ඔහුගේ ක්‍රියාව සාර්ථක විය. ඉතාම කුඩා සැත්කමක් වූ වාසෙක්තමි සැත්කමට මුහුණ දී ඔහු රුපියල් පන්සියෙන් මත් වූවේය. එහෙත් ඒ වන විට අවිවාහක තරුණයෙකු බව ඔහුට නිනව්වක් නොවීය. කෙ-මෙන් කෙමෙන් ගලායන ආදර හමුවේ අසරණියක වූ චන්ද්‍රිකා ඒ වන විටත් තරුණියක නොව ගැහැණියක වී සිටියාය. වා-සෙක්තම සැත්කම කළාට ලිංගික ක්‍රියාවලියට කිසිදු බාධාවක් නැත. එයින් සිදුකරන්නේ ශුක්‍රාණු අඩපණ කිරීම පමණි.

පසු කලෙක සුනිල් මත් ලෝලියකු බව ඇය හැඳින ගත්තාය. එහෙත් ඒ වන විට ඇයට සුනිල්ගෙන් පලා යාමට නොහැක. ඇය තමන්ගේ සේසතම ඔහු වෙනුවෙන් වියදම් කර, සුනිල්ව පුනරුත්ථාපනය කර යහමගට ගත්තාය. එහෙත් ඇය කිසි විටෙකත් දරුවෙක් ලබා ගැනීමට වෙනත් පිරිමින්ගේ පහස පැතුවේ නැත. ඇය එදා මෙන්ම සුනිල්ට තවමත් ආදාරය කරන අවංක ගැහැණියකි. වසර ගණනාවක් කුලී නිවෙස්වල ජීවත් වූ සුනිල් සහ ඇය තවමත් ජීවත්වන්නේ තැන් තැන්වලට යමින් එවැනි කුලී නිවෙස්වලය. සුනිල් මාලබේ පොළේ කුඩා ව්‍යාපාරයක් කරගෙන යන අතර ඔහුට ත්‍රිරෝද රථයක් ද උරුම කර දුන්නේ චන්ද්‍රිකා අක්කාය. ඒ තමා අවුරුදු ගණනාවක් කැඹුරු ඇඟලුම් කම්හලේ රැකියාවෙන් ඉවත්ව ලබා ගත් පාරිතෝෂික මුදල් හා බැංකු ණයක් මගිනි. සුනිල්ගේ ත්‍රි විලරයේ පිටුපස සිංහලේ කියා ස්ටිකරයක් අලවා

සිංහලේ අභිමානය වෙනුවෙන් ජාතිය බෝ කරන ලෙස සුනිල් නඟනු හඬය. එසේම ඔහු මෑතක සිට මුස්ලිම් කෑම කඩ වර්ජනය කරන මෙන් දන්නා හඳුනන පුද්ගලයන්ගෙන් ඉල්ලා සිටියි. ඒ මුස්ලිම් කෑම කඩවල ආහාරවලට වඳ පෙති මිශ්‍ර කරනවා යන අමූලික ඔප්පු කර ගත නොහැකි කරුණක් සමගිනි. එහෙත් මේ කිසිදු දෙයක් පිළිබඳ අවධානයෙක් නැති තලතුනා චන්ද්‍රිකා අක්කා ඒවාට හිකි හිකි ගා සිනාසෙයි.

**සන්නස නව ගිණුම් අංකය**

**Account Name - Sannasa Pty Ltd**
BSB - 013303
Acc - 208133398

